---

**පල්ලේපොල ප්‍රාදේශීය සභාව**

**මාතලේ දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 02 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ජූලි 30 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතුකොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති පල්ලේපොල ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ). සමාලෝචිත වර්ෂයට අදාලව 2013 වර්ෂයේදී ගෙවන ලද රු.1,805,235ක් වෙනුවෙන් ණයහිමියන් යටතේ ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ). රු.470,000ක් වටිනා ඉඩම් කට්ටි 08ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ). එකතු වටිනාකම රු.1,442,310ක් වූ කැබ්රප්යේ කැබින් එක පසුපස තට්ටුව හා මේස අගුලු 15ක වටිනාකම ප්‍රාග්ධන වියදම් යටතේ ගිණුම්ගත කිරීමකින් තොරව පුනරාවර්තන වියදම් සේ ගිණුම්ගත කර තිබුණි.

(ඈ). සමාලෝචිත වර්ෂයේදී ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු කොන්ක්‍රීට් මිශ්‍රන යන්ත්‍රයේ වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 නොසැසඳු පාලන ගිණුම්

ගිණුම් විෂයන් 03කට අයත් පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.30,994,608 ක් වූ අතර, උපයෝගී ලේඛන හා වාර්තා අනුව එම ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.9,312,091 ක් විය. මේ අනුව රු.21,682,517ක වෙනසක් අනාවරණය විය.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ). පිළිතුරු නොලත් විගණන විමසුම්

2013 මැයි 31 දින වන විට විගණන විමසුම් 02කට පිළිතුරු සපයා නොතිබුණි. එකී විමසුම්වලට භාජනය වූ ගණනය කළහැකි ගනුදෙනුවල වටිනාකම රු.279,250 ක් විය.

(ආ). තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.2,526,348ක් වූ ගනුදෙනු විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,542,074 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,937,283 ක් විය.

2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). අවශ්‍යතාවය පිළිබඳ නිසි හඳුනා ගැනීමකින් තොරව ප්‍රතිපාදන සලසාගෙන තිබීම හේතුවෙන් වැය විෂයයන් 14කට අදාලව රු.818,000ක සමස්ථ ප්‍රතිපාදනයම වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි.

(ආ). 1996 වර්ෂයේ සිට මහජන බැංකුවේ සාමාන්‍ය ඉතිරි කිරීමේ ගිණුමක ඇති රු.270,553ක බැංකු තැන්පත් ශේෂයක් වැඩි ප්‍රතිලාභයක් ලැබෙන ආයෝජන ක්ෂේත්‍රයක ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ). ආයතනමය කටයුතු නිසි වැඩ බෙදීමක් මත සිදුකළ යුතු වුවද, චෙක්පත් ලිවීම හා නිකුත් කිරීම, මුදල් පොතේ සටහන් කිරීම, බැංකු සැසඳුම් පිළියෙල කිරීම, වවුචර්පත් භාරකාරීත්වය හා අභ්‍යන්තර විගණනය යනාදී කටයුතු එකම නිලධාරියෙකු විසින් සිදුකර තිබීම හේතුවෙන් ශක්තිමත් මූල්‍ය පාලන ක්‍රමයක් නොමැති බව නිරීක්ෂණය විය.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. ' 000 |
| (i). වරිපනම් හා බදු | 391 | 316 | 368 |
| (ii). බදු කුලි | 561 | 413 | 164 |
| (iii). බලපත්‍ර ගාස්තු | 652 | 666 | 50 |
| (iv). වෙනත් ආදායම් | 17,378 | 18,364 | 4,772 |

### 2.3.2 වරිපනම් හා අක්කර බදු

(අ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි වරිපනම් හා අක්කර බදු පිළිවෙලින් රු.267,372ක් හා රු.101,104ක් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) (අ) වගන්තිය අනුව අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ආ). ප්‍රාදේශීය සභාව විසින් සපයනු ලබන පහසුකම් වැඩිවීම මත 2009 වර්ෂයේ සිට දියුණු කළ ප්‍රදේශ වශයෙන් ප්‍රකාශිත සීමාව පුළුල් කර වරිපනම් බදු අය කිරීම සඳහා තීරණය කර විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීම සඳහා 2009 ජුනි 17 දින යවා ඇතත්, එකී කාර්යය ඉටු වී

නොතිබුණි. එසේම අවසන් වරට වරිපනම් බදු ප්‍රතිශෝධනය කළ 2004 ජනවාරි 01 දිනෙන් පසුව වර්ෂ 09 ක් ගතවී තිබියදීත් යළි වරිපනම් ප්‍රතිශෝධනයක් සිදුකර නොතිබුණි.

2.3.3 බලපත්‍ර ගාස්තු

2002 වර්ෂයට පෙර සිට පැවත එන හිඟහිටි වෙළඳ බලපත්‍ර ගාස්තුව වූ රු.49,739ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත්, අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i). | උසාවි දඩ | 1,239,750 |
| (ii). | මුද්දර ගාස්තු | 2,751,842 |

2.4 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

(අ). නිශ්ක්‍රීය හා ඌන උපයෝජිතව පැවති වටිනාකම රු1,021,350ක් වූ වත්කම් ඒකක 09ක් හා වටිනාකම ගණනය කළ නොහැකි වත්කම් ඒකක 05ක් පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

(ආ). 2012 පෙබරවාරි මස ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් සභාව වෙත ලැබී තිබූ කොන්ක්‍රීට් මිශ්‍රන යන්ත්‍රය ඵලදායී කාර්යයකට යොදා නොගෙන ස්වභාවික ආපදාවන්ට ලක්වෙමින් සභා භූමියේ පැවතුණි.

2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 (1) (1) වගන්තියට අනුව, තනතුරක් ඇති කිරීම හා වැටුප් නියම කිරීම සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවද, එසේ අනුමැතිය ලබානොගෙන සේවකයින් 16 දෙනෙකු දෛනිකව බඳවාගෙන සමාලෝචිත වර්ෂයේ රු.2,329,796ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

---

2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). 1954 අංක 53 දරන පනතින් සංශෝධිත නිවාස හා නගර සංවර්ධන ආඥා පනතේ (199 වැනි අධිකාරය) 5 සහ 6 (1) වැනි වගන්ති අනුව අනුමත සැලසුම් මත ඉදිකරන ගොඩනැගිලි නිමකිරීමෙන් අනතුරුව ඒ සඳහා අනුකූලතා සහතික නිකුත් කළයුතු වුවත්, 2010, 2011 හා 2012 වර්ෂවල අනුමත කළ ගොඩනැගිලි සැලසුම් අයදුම්පත්‍ර 123 න් 114 ක් සඳහා අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණි.

(ආ). 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 207, 208 රීති හා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1:4, 3:4 හා 6:3 ඡේද අනුව තරඟකාරි මිල සැඳැහුම් ක්‍රමය අනුගමනය කර, මිලදී ගැනීම් කළයුතු වුවත්, එසේ කිරීමකින් තොරව අත්මිල ගණන් මත අවස්ථා 05 කදී රු.564,795 ක් වටිනා භාණ්ඩ මිලදීගෙන තිබුණි.

(ඇ). 2005 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.196,862ක් වටිනා ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 පරිදි කටයුතු කර නොතිබුණි.

(ඈ). සභාපතිවරයා ඇතුළු කාර්යමණ්ඩල නිලධාරින් විවිධ ගමන් යෑම සඳහා අවස්ථා 13කදී රු.96,786ක් වැයකර පෞද්ගලික වාහන හිමිකරුවන් වෙතින් ප්‍රවාහන පහසුකම් සලසාගෙන තිබුණ ද, එකී ගමන් රාජකාරි ගමන් බවට තහවුරු කර ගැනීම සඳහා අදාළ කැඳවීමේ ලිපි හා පැමිණීමේ සහතික විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඉ). 2002 සිට 2009 දක්වා කාල පරිච්ඡේදයට අදාල ණයගැති හා ණයහිමි ශේෂ පිළිවෙලින් රු.1,004,051ක් හා රු.569,558ක් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත්, කටයුතු කර නොතිබුණි.

(ඊ). සභාවට අයත් පෙරපාසැල් ගොඩනැගිල්ල හා මිල්ලවාන පුස්තකාල ගොඩනැගිල්ල 2011 වර්ෂයේදී කුලියට හා බද්දට ලබාදී ඇතත්, 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා අදාල කාල පරිච්ඡේදය තුළ හිඟහිටි බදුකුලී එකතුව රු.39,800ක් අයකර ගැනීමට හෝ ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීමට හෝ සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

2.7 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

සභා බලප්‍රදේශයේ දෛනිකව එකතු කෙරෙන කසළ සභා සීමාව තුළ පිහිටි ඇහැලේපොල වත්ත නමින් පෞද්ගලික ඉඩමකට බැහැර කර පස් දමා වසා දමන බව නිරීක්ෂණය විය. මේ අනුව කසළ බැහැර කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය නොකරන බවත් කසළ ප්‍රතිචක්‍රීයකරණ වැඩසටහන් සඳහා යොමුවී නොමැති බවත් අනාවරණය විය.

---

3. පද්ධති හා පාලන
---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ). අයවැය පාලනය

(ඇ). අභ්‍යන්තර පාලනය

(ඈ). ආදායම් පරිපාලනය

(ඉ). ණයගැති හා ණයහිමි පාලනය

(ඊ). ගබඩා පාලනය